// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1917/47 - 2015 ජුනි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2015.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2003 අංක 2 දරන මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය යටතේ මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ඉවත් කිරීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම, මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2003 අංක 2 දරන මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියේ 1 වන කොටසේ අංක 3(1) සහ (2) වගන්ති ප්‍රකාරව අංක 1847/4 - 2014 ජනවාරි 27 දිනැති ගැසට් පත්‍රය මගින් මවිසින් පත් කරන ලද, මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් එම ප්‍රඥප්තියේම 1 වන කොටසේ 3(8) වගන්තිය ප්‍රකාරව මාවෙත පැවරී ඇති බලතල අනුව ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන දින සිට බලපැවැත්වෙන පරිදි මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

එදිරිවීර වීරවර්ධන,
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

| *නම* | *ලිපිනය* | *තනතුර* | *ඉවත් කරන දිනය* |
|---|---|---|---|
| එස්. එම්. ආර්. බී. සමරකෝන් මහතා | නියංගොඩ කුඹුරේගම | සභාපති (සාමාජික) | 2015.06.04 |
| එම්. ආර්. ජී. එච්. දසනායක මහතා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා ප්‍රගති පාලන) ප්‍රධාන ලේකම් කාර්යාලය, පල්ලේකැලේ. | සාමාජික | 2015.06.04 |
| ජී. පී. එච්. මහානාම මහතා | ප්‍රධාන ගණකාධිකාරී, මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය. | සාමාජික | 2015.06.04 |
| චන්දන මෙන්ඩිස් මහතා | 103/1, මැදගොඩ, පූජාපිටිය. | සාමාජික | 2015.06.04 |
| අයි. ඩබ්ලියු උඩබේපාල මහතා | 148/29, ජෝර්ජ් ඊ ද සිල්වා මාවත මහනුවර. | සාමාජික | 2015.06.04 |

06 -550